## වයස්ගත පුද්ගලයන් සඳහා වූ COVID-19 උපකාරක දුරකථන මාර්ගය

වයස්ගත පුද්ගලයන් සඳහා වූ COVID-19 උපකාරක දුරකථන මාර්ගය වයස්ගත ඕස්ට්‍රේලියානුවන් සඳහා තොරතුරු, උපකාර සපයමින් සම්බන්ධතාව පවත්වා ගනියි.

සමහර වයස්ගත පුද්ගලයන් COVID-19 වලින් අවදානමට ලක් වුවද අන්තර්ජාලය සමග ඇති සම්බන්ධතාව අඩුය. ඔවුන්ගේ ගැටළු සඳහා ප්‍රවේශ වීමට තොරතුරු ලබා දීමේ මාධ්‍ය අවශ්‍යය. වයස්ගත පුද්ගලයන් සඳහා වූ COVID-19 උපකාරක මාර්ගය මගින් ඔවුන්හට තොරතුරු සහ උපකාර සපයයි.

පහත අවශ්‍යතා ඇතිනම් වයස්ගත ඕස්ට්‍රේලියානුවන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ රැක බලා ගන්නන්ට 1800 171 866 අංකයට නොමිලේ ඇමතුමක් ලබා ගත හැකිය:

- COVID-19 සීමාවන් සහ තමන්ට එයින් ඇති වී තිබෙන බලපෑම ගැන යමකු සමග කතා කිරීමට කැමැත්තෙන් සිටී නම්,
- තනිකම දැනේ නම් හෝ ආදරණීයයකු පිළිබඳ කණගාටු වෙමින් සිටියි නම්
- යමකු රැකබලා ගනියි නම් තොරතුරු අවශ්‍ය නම් හෝ යමකුට කතා කිරීමට කැමැත්තෙන් සිටී නම්.
- තමන්ට ලැබෙන වයස්ගත රැකවරණ සේවා පිළිබඳ උපදෙස් අවශ්‍ය නම් හෝ ඒවා වෙනස් කිරීමට උපකාර අවශ්‍ය නම්
- නව රැකවරණ සේවා වෙත ප්‍රවේශ වීමට හෝ සාප්පු යාම වැනි අත්‍යවශ්‍ය සේවා ලබා ගැනීමට උපකාර අවශ්‍ය නම්
- ඩිමෙන්ෂියාවෙන් පෙළෙයි නම් හෝ ඉන් පෙළෙන මිතුරකු හෝ පවුලේ සාමාජිකයකු ගැන ප්‍රශ්නයක් තිබේ නම්.
- තමන් වෙනුවෙන් හෝ වෙනත් අයකු වෙනුවෙන් කාලයකට වරක් හෝ නිතිපතා කෙරෙන පරීක්ෂණයක් පිළියෙළ කර ගැනීමට අවශ්‍ය නම්.

වයස්ගත ඕස්ට්‍රේලියානුවන්ට, ඔවුන්ගේ ඥාතීන්ට, රැක බලා ගන්නන්ට, මිතුරන්ට සහ ආධාරකරුවන්ට:

- **1800 171 866 අංකය මගින්**
- සතියේ දිනවල පෙව 8.30 – පව 6 AEST කාලය තුළ
- ඔවුන්ටඅවශ්‍ය ඕනෑම තොරතුරක් හෝ සේවාවක් සඳහා ඇමතීම කළ හැක.

වයස්ගත පුද්ගලයන් සඳහා වූ COVID-19 උපකාරක සේවය පහත ආයතනවල ඒකාබද්ධ ප්‍රයත්නයකි:

- COTA Australia,
- Dementia Australia,
- National Seniors සහ
- OPAN,
- ඕස්ට්‍රේලියානු රජය මගින් අරමුදල් ලබා දෙන ව්‍යාපෘතියකි.

## භාෂා සහ භාෂණ පරිවර්තන (TIS) උපකාරක සේවය

ඉංග්‍රීසි කතා කළ නොහැකි වයස්ගත ඕස්ට්‍රේලියානුවන්ට පහත දේවල් සිදු කළ හැකිය:

- 131 450 අංකයට TIS National ඇමතීම,
- භාෂණ පරිවර්තකයකු ඉල්ලා සිටීම සහ
- වයස්ගත පුද්ගලයන් සඳහා වූ COVID-19 උපකාරක දුරකථන අංකය ලබා දෙන ලෙස ඉල්ලා සිටීම හෝ 1800 171 866 දුරකථන අංකයට සම්බන්ධ කරන ලෙස ඉල්ලා සිටීම.